**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2020**

-----------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 15 හි 14 ඡේදය ප්‍රකාරව අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් සහ එම වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | ගණකාධිකාරී උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව අදාළ නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව වෙත සිදුකරන ලද රු.1,380,015 ක ආපසු ගෙවනු ලබන තැන්පතුව වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන වල අදාළ නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ප්‍රකාශන තොගය | 438,730 | සමීක්ෂණ හා තක්සේරු වාර්තා | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්‍ෂණය නියමිත දිනට සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) උපදේශක සභා රැස්වීම් වාර්තා | - | උපදේශක සභා 11 ක රැස්වීම්වලදී ගන්නා ලද තීරණ හා ලබාදෙන ලද උපදේශනයන් ඇතුලත් රැස්වීම් වාර්තා | උපදේශක සභා රැස්වීම් වාර්තා අනුමණ්ඩල ලේකම්වරුන් හා සහකාර ලේකම්වරුන් වෙතින් ලබා ගෙන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 381(1) | ජංගම ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාරයඅනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | භාණ්ඩ සමීක්ෂණ සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යාල පරිශ්‍රයක් ලබා ගැනීමට පමා වීම සහ කාර්යාල උපකරණ අතරමැදි ස්ථානයක ගොඩගසා තිබීම හේතුවෙන් භාණ්ඩ සමීක්‍ෂණය සිදු කිරීමට නොහැකි විය. 2021 වර්ෂය සඳහා නියමිත පරිදි භාණ්ඩ සමීක්‍ෂණය සිදු කිරීමට පියවර ගනු ලැබේ. | නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.6 ඡේදය | රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තා නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත පරිදි වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය |
| (ii) 5.2.5 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ඉදිරිපත් කරනු ලැබේ. | නියමිත පරිදි අයවැය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නිවැරදිව පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.737,820 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,917,377ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,655,197 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රතිපාදන අඩුවෙන් ලැබීම හා පරිපාලන හා ආයතන වියදම්හි වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කලා උපදේශක මණ්ඩල සහ සංස්කෘතික නියෝජිතායතනයන්ගේ ජාත්‍යන්තර සම්මේලනයෙහි (International Federation of Arts Councils and Culture Agencies) සමාජිකත්වය 2019 – 2021 කාලය සඳහා අලුත් කිරීම වෙනුවෙන් වසරකට ඕස්ට්‍රේලියානු ඩොලර් 700 බැගින් වසර 03 ක් සඳහා ඩොලර් 2100 ක් ගෙවිය යුතුව පැවතියද ඒ සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 2700 ක් අදාළ ආයතනය වෙත ගෙවා තිබුණි. ඒ අනුව ඕස්ට්‍රේලියානු ඩොලර් 600 ක් හෙවත් රු.80,413 ක් වැඩිපුර ගෙවා තිබුණි. | IFACCA ජාත්‍යන්තර කලා සංවිධානයේ 2019 සිට 2021 වර්ෂය දක්වා වසර 03ක කාලය සඳහා සාමාජිකත්වය අලුත් කිරීම වෙනුවෙන් සංවිධානය විසින් එවූ ඉන්වොයිස් පත්‍රය අනුව 2019-2021 වසර වලදී සාමාජික ගාස්තුව ඕස්ට්‍රේලියානු ඩොලර් 2700කි. ඉන්වොයිසිය සමඟ යොමු කළ ලිපියේ වසරකට ඕස්ට්‍රේලියානු ඩොලර් 100ක් පමණක් සාමාජික මුදල් වැඩි වන බව සඳහන් වීම කෙරෙහි අවධානය යොමු නොවීම අප අතින් සිදු වූ වරදකි. එම ගෙවීමේ පරස්පරතාවය සම්බන්ධයෙන් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ සඳහන් කර ඇත්තේ ලිපියේ සඳහන් වූ සාමාජික මුදලේ වැඩිවීම ඔවුන්ගේ කාර්යාලයේ නිලධාරියකු අතින් සිදු වූ දෝෂයක් බවත් මෙම වැරද්ද සම්බන්ධයෙන් රාජකාරී මට්ටමින් ලිපියක් නිකුත් කරන බවත්ය. ඉන්වොයිසියේ සඳහන් අප විසින් ගෙවූ මුදල නිවැරදි බවද සඳහන් කර ඇත.<br>ඒ අනුව කිසිදු අයුරකින් වැඩිපුර ගෙවීමක් සිදු කර නොමැති බව කාරුණිකව දන්වමි. | වැඩිපුර ගෙවූ රු.80,413 අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කලා සඟරාවේ පිටපත් 500 ක් හා අනෙකුත් කලා ග්‍රන්ථ 27000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 78,840 ක් හා රු. 981,218 ක් වූ කොන්ත්‍රාත් පුද්ගලික සමාගමක් වෙත පැවරීමේදී ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 5.4.4 ට පටහැනිව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 75 බැගින් එනම් පිළිවෙලින් රු.59,130 ක් හා රු. 735,913 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ අතර අත්තිකාරම් සුරක්ෂණ ලබාගෙනද නොතිබුණි. | ඉදිරියේ දී අදාළ පරිදි ගිවිසුම් වලට එළඹීමට හා අත්තිකාරම් සුරක්‍ෂණ ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. අත්තිකාරම් ගෙවීම සිදු කරන දින වන විට ප්‍රකාශන සියල්ලෙහි සියලුම ආකෘති සකස් කර අවසන් මුද්‍රණයට අනුමැතිය ලබා ගැනීම සඳහා අප ආයතනය වෙත ලබා දී තිබීම හේතුවෙන් 75%ක අත්තිකාරමක් ගෙවීමට පියවර ගන්නා ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ 2021 මාර්තු 30 වන දින වන අතර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරද නොතිබුණි. | ඉදිරියේ දී නියමිත දිනට ඉදිරිපත් කරනු ලැබේ. | නියමිත දිනට වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |